# ජීවය රැකදෙන සම්පත් සුරකිමු!



දුලනි දුලන්සා සතරසිංහ

# පිදුම

මගේ මෙම පොත මගේ සීයලා වන පියසේන සතරසිංහ සහ නැසීගිය එන්. මහීපාල පෙරේරා නාමයටත්, ආච්චිලා වන රංජනී බැස්ටියන්ස් සහ චන්ද්‍රා වීරසිංහ වෙත ඉතා ආදරයෙන් පුද කරමි.

# ස්තුතිය

අපට දැනුම ලබාදෙමින් යහපත් දරුවන් ලෙස මෙලොවට දායාද කරන්නට නිරන්තර වෙර දරණ කොළඹ 07, සිරිමවෝ බණ්ඩාරනායක විදුහල් මාතාව, විද්‍යාලයේ විදුහල්පති තුමිය සහ ආදරණීය ගුරු මෑණිවරු සහ පියවරුන්හට මම ස්තුතිවන්ත වෙමි.

දිවා රෑ වෙහෙස නොබලා අපව පෝෂණය කරන්නට, දැනුම ලබා දෙන්නට, යහමග යවන්නට වෙර දරන ආදරණීය අම්මා සහ තාත්තාට මම ස්තුතිවන්ත වෙමි.

අවසාන වශයෙන් නිරන්තරයෙන් අපගැන සොයා බලමින්, අපගේ ජයග්‍රහණයන්හි මෙන්ම පරාජයන්හිදීත් අපව තව තවත් දිරිගන්වමින් අපව සතුටින් තබන්නට වෙහෙසෙන දයාබර ආච්චිලා, සීයා ඇතුළු නෑදෑයින් සහ මාගේ දයාබර යහළු යෙහෙළියන් හට ස්තුතිවන්ත වීමට මම මෙය අවස්ථාවක් කර ගනිමි.

# පෙරවදන

භාෂාවක් මනුෂ්‍යයාට අවශ්‍ය වන්නේ සිය අදහස් හැඟීම් දැනීම් අන්‍යයන් හා බෙදා හදා ගැනීමටය. මිනිසාගේ සන්නිවේදන මාධ්‍යය වනුයේ භාෂාවයි. කවර භාෂාවකින් වුව ඔහු සිදු කරන්නනේ සිය සිතැඟි අනුන් හා බෙදා හදා ගැනීමය. භාෂාවක් අලංකාර වනුයේ එම භාෂාවට අනන්‍යය වූ ලේඛන ශෛලියන්, ව්‍යාකරණ රීති, නීති හා භාවිතයේ දී අනුගමනය කරන රටාවන් හා සීමාවන් මතය. ලෝකයේ භාෂා 6500 පමණ භාවිතාකරන අතර සිංහල භාෂාව භාවිතා කරන්නේ ලෝක ජනගහනයෙන් 0.27% පමණ වන ශ්‍රී ලාංකිකයෝය. එයින්ද 11.2% දෙමළ භාෂාව භාවිතා කරන අතර සිංහල භාෂාව භාවිතා කරන සෙසු බහුතරය අතර ඉංග්‍රීසි භාෂාව ඉතා ඉහලින් පිළිගන්නා හෙළ බස නොසලකන සුලුතරයක්ද සිටිති.
සිංහල භාෂාව පිළිබඳව විවිධ ආකල්ප ද, මතිමතාන්තර රැසක් ද සමාජගතව ඇති මෙවන් සමයක පුංචි දියණියගේ මෙම උත්සාහය පැසසිය යුතු සහ අගය කල යුත්තකි.

අනාගතයේ බිහිවන සම්භාවනීය ලේඛිකාවකගේ ඡායාව ඇය තුළින් මම දකිමි.

ඇය සිය කතාව තමා ජීවත් වන පරිසරය සමග සෘජුව බැඳ තබාගැනීමට උත්සාහ කර ඇත්තීය. සිය ගම්මානය, එහි පරිසරය, පාසල් යන ගමන, ජලය හා බැඳුනු ගැමි ජීවන රටාව, එහි ජීවත් වන්නන් සොබාදහම සහ මනුෂ්‍ය ක්‍රියා නිසා විදින දුෂ්කරතාවයන් ඒ පිළිබඳ ඇය තුළින් මතුවන සංවේදනයන් ද ඇය අපූරුවට විස්තර කරයි.
දුලනි සිය කතාවෙන් තම සගයන්ට අගනා පණිවුඩයක් කියන්නී ය. සොබා දහමට ආදරය කල යුතු බවත් අනාගතය වෙනුවෙන් අප එය ආරක්ෂා කල යුතු බවත් එසේ කිරීමට සැම දෙන ධෛර්යයෙන් සහ අධිෂ්ඨානයෙන් කටයුතු කල යුතු බවත් ඇය සිය කතාවෙන් පවසන්නීය.

සිය කතාව තුල පාසල් දරුවකු සතුව තිබිය යුතු අධිෂ්ඨානශීලී ස්වභාවය, දෙමාපිය ගුරුවරු වැඩිහිටියන් කෙරෙහි දරුවන් පැවතිය යුතු ආකාරයද දක්වා තිබීම ද සඳහන් කළ යුතුය. කතාවක තිබිය යුතු ගුණාංග ඉගෙනීමට ඇය තවමත් කුඩා නමුත්, කියවන්නා තුල මනෝ රූප මැවීමට ඇගේ කතාව සමත් බව කිව යුතුය. මග දෙපස ඇති ගඩාගෙඩි කමින් පාසල් යන ළමුන් රංචුව, කොටං පැටවූ ලොරිය පටු පාර දිගේ වේගයෙන් ඇදීයන අයුරු, ගලායන වතුර නවත්වන්නට කතා නායකයා උත්සාහ කරන අයුරු, ආදී සියලු සිදුවීම් මනසේ මැවී යන අයුරින් ඇය විස්තර කරයි.

නිසි දැක්මකින් තොර ලේඛනයේ යෙදෙන නූතන නවකතා කරුවන් අතර වල්වැදී ඇති සිංහල කතාකරණයට නව අරුත් ගෙන එන කතාකරුවන් අනාගත පරපුරෙන් හෝ බිහිවිය යුතුමය. දරුවන්ගේ මෙවන් උත්සාහයන් හෙළ බසට ආදරය කරන සැමට මහත් අස්වැසිල්ලකි. අනාගතයේ පීදෙන්නට වෙර දරන මෙවන් මල් කැකුලු වර්තමානයෙන් රැකගෙන, අනාගතය උදෙසා පිපෙන්නට අවැසි සත්කාර කිරීම වැඩිහිටි අපේ පරම යුතුකමකි.

ඇයගේ මෙම කතා පොත ප්‍රසංසනීය උත්සාහයකි. මාගේ දියණිය අනාගතයේ ප්‍රවීන, උසස් නිර්මාණ සිංහල කතාකරණයට රැගෙන එන, බස සුරකින, එය පෝෂණය කරන සම්මානනීය ලේඛිකාවක් වනු ඇති බව මගේ විශ්වාසයයි. දූලනි දියණියට මාගේ හදපිරි සුභාශිංසන පිරිනමමි.


එන්. තුෂාරිකා දිල්රුක්ෂි පෙරේරා

විද්‍යාවේදී උපාධි (විවෘත විශ්වවිද්‍යාලය )

පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (ජාතික අධ්‍යාපන ආයතනය )

අධ්‍යාපන ශාස්ත්‍රපති උපාධි (විවෘත විශ්වවිද්‍යාලය )

විද්‍යාපීඨ පුහුණු ගුරු

ගුරුතුමිය, ගේට්වේ ජාත්‍යන්තර පාසල, දෙහිවල

# අපේ ගම

චුට්ටේ, මලී, බින්දු මගේ හොඳම යාලුවෝ. අපේ අම්මා කියනවා අපි ජීවත් වෙන්නේ ලංකාවේ ඉතාම දුෂ්කර පළාතකලු. අපි ගමන් බිමන් යන්නේ පයින්. බස් එකක් උදේ ටවුමට ගිහින් ආයෙ ගමට එන්නෙ හුඟක් ඇඳිරි වැටුනහම. ඒකෙ යන්න මම ගොඩක් ආසයි. මම වගේම ගමේ පොඩි ළමයි ඒකෙ නැගලා රවුමක් යන්න කොයිතරම් ආස උනත් කාසි නැති නිසා කොන්දොස්තර මාමා අපිව එලවගන්නවා. එතකොට අපි බස් එක පස්සෙන් කකුල් දෙක රිදෙනකල් දුවගෙන යනවා.



පාර ඇරුනහම අපේ ගමේ හැමතැනම කැළෑව. දුරින් දුරින් ගෙවල් කීපයක් තියනව. වතුර හිඟ නිසා වැඩිපුර තියෙන්නෙ කටු පිරුණු ගස් වැල් වර්ග.

ඇල දොල ගංගා, මහ මුහුද ගැන වැඩිහිටියො කියන කතා අහන්න මම හරිම ආසයි. මම ලොකු උනහම ඒව තියන තැන් සොයාගෙන යනවමයි. ඉඳහිට වහිනකොට අපේ ගමම මගුල් ගෙයක් වගෙයි. ඒ දවස්වලට අපේ ගමේ හේන් වගාකරන සීයල අහස දිහාවට වඳිනව මම දැකල තියනව. අපේ අම්ම මට කියන්නෙ අහස් දියෙන් වගා කරන අපට වැස්ස ලබාදුන්නු නිසාලු එහෙම කරන්නෙ. කවුද අපට වැස්ස දෙන්නෙ කියල මට හරියටම තේරෙන්නෙ නැහැ. ගොඩ කාලයක් තිස්සෙ නියඟය. පෙළක් දවස්වල වගා කරපුව විනාස වෙන තරම් වැස්ස අපට ලැබෙනව. ආච්චි කියන්නෙ ඒක වැස්ස වලාහක දෙවියො කෝප උනහම වෙන දෙයක්ලු.



අපේ ගම අවුරුද්දෙ වැඩි කාලයක් අපට පෙනෙන්නේ ගුරු පාටින්. ඉඳහිට මොණරෙකු අඬන හඬ අපට ඇහෙනවා. ගමේ කෙළවර, කෙළවරක් නොපෙනෙන වෙල් යායක් තියෙනවා. මහන්සිය නිවාගැනීමට තාලයට කවි සීපද කියන මාමලා නැන්දලා එහි සිටිනවා. ගොඩක් දුරට ඇහෙන්නට තාලයට ඒ කවි කියන හැටි අහන්නට මම හරිම ආසයි. පුංචි කඳු ගැටයක් මුදුනේ ගමේ පන්සල තියෙනවා. උසින් තියෙන නිසා මුළු ගමටම එය පෙනෙනවා. පෝය දවසට පන්සලේ තියෙන සන්ටාරයේ හඬ මුළු ගමටම ඇහෙනවා.



# ~ පාසල් ගමන ~

අපි ඉස්කෝලේ යන්නෙත් ගොඩක් දුර පයින් ගිහින්. ඒ විතරක් නෙවෙයි හවසට අපි කළගෙඩි අරන් බොන්න වතුර ගේන්න වතුර නළය තියෙන තැනට ගොඩක් දුර පයින් යනවා. පුංචි අපිට ඒක හරිම විනෝදයක් වුණාට අම්මයි, තාත්තයි ගොඩක් මහන්සි වෙනවා කියලා අපට දැනෙනවා. පුංචි කළගෙඩියක් මට දීලා අම්මයි තාත්තයි ලොකු කළගෙඩි දෙක බැගින් අරන් එනවා. විටින් විට ඒව බිමින් තියල මහන්සි අරිනවා. තව ටික දුරයි තියෙන්නෙ කියල තාත්ත අපිව දිරිමත් කළත් තාත්තගේ ඇගෙන් දාඩිය වැක්කෙරෙනවා මම දැකලා තියෙනවා. ලොකු උනහම කොහොමහරි නළ ජලය අරන් ඔවුන්ට පහසුවෙන් වතුර ගන්න විදියක් මම හදලා දෙනවාමයි. ඒ විතරක් නොවෙයි. අපි වගේ කළගෙඩි අරන් ගොඩක් දුර වතුර සොයාගෙන යන අහල පහල හැමෝටම මම අපේ ගෙදරින් වතුර දෙනවා.



අපි පාසල් යන්නේ ගුරු පාරින් ගිහින් වෙල මැදින් ගිහින් තාරපාරට ඇවිත් තවත් සැහෙන දුරක් පයින් ගිය පසුයි. පාරේ තැන් දෙකක වෙරළු ගස් තියෙනවා. ගඳපාන, කිරිල්ල, වීර වැනි ගස්වල ගෙඩි කමින් අපි මේ ගමන යනවා. ගඩාගෙඩි කකා යන නිසා අපට මහන්සියක් දැනෙන්නේ නැහැ.

අපේ පාසල මිශ්‍ර පාසලක්. ළමයි සීයක් විතර විවිධ පංති වල ඉගෙනගන්නවා. බොහොම අපහසුකම් මැද අපි ඉගෙනගන්නෙ. ගොඩක් ළමයින්ට පාසල් අඳින්න හරිහමන් ඇඳුමක් වත් නැහැ. ගොඩක් ළමයි සෙරෙප්පු දමල තමයි පාසල් ආවෙ. ගුරුවරු හිටියේ බොහොම ටිකදෙනයි. නමුත් අප පාසලේ සංගම් කිහිපයක්ම තිබුණා. මම පරිසර සංගමයේ සාමාජිකාවක් වගේම නායිකාවක්.



විවිධ ක්‍රීඩා කරන්න අපට ඕනෑ උනත් ඒවාට අවශ්‍ය පහසුකම් අපට තිබුනේ නැහැ. අපි කලේ පාසල අවසාන වුනු ගමන්ම යහළු යෙහෙළියන් සමග පාසල් වත්තේ දුවපැන හිතේ හැටියට සෙල්ලම් කරන එක. අපට බනින්නට කවුරුවත් හිටියේ නැහැ. බඩගිනි වෙන්නෙත් නැහැ සෙල්ලම් කරනකොට. සතියේ සිකුරාදා දවසේ පාසලෙන් පසු පරිසර සංගමය පවත්වනවා. ළමයි හැමෝම වගෙ එයට සහභාගී වෙනවා. පුංචි අපට අප අවට පරිසරය ගැන, පරිසරයේ සම්පත් ගැන, ඒවා ආරක්ෂා කරගතයුතු බව මෙහිදී කියා දෙනවා. අපට ආසහිතෙන විවිධ ක්‍රියාකාරකම් කරන නිසා අපි කවදාවත් සිකුරාදා දිනයට පාසල් නැවිත් ඉන්නේ නැහැ.





අද බ්‍රහස්පතින්දා දවසක්. වෙනදා වගේම යාලුවෝ එක්ක අදත් ටිකක් හවස් වන තුරු පාසල් වත්තේ මම සෙල්ලම් කලා.

පාසලේ මුරට ඉන්න මාමා කොහේදෝ ඉඳන් ආවා.

"ළමයිනේ, දැන් හොඳටම හවස්වෙලා. දෙමාපියෝ බලාගෙන ඇති."

"අනෙක ඔය ළමයි මුකුත් කාලත් නැහැ නේද දවල්ට?"

"දැන් ගෙවල් වලට යන්න." ඔහු අපට කියුවා.

අපි හනි හනිකට ගෙදර එන්න පිටත් වුණා.



# අනතුර

සැහෙන දුරක් එනකොට අපි කලාතුරකින් දකින වාහනයක් විශාල ලී කොටන් තොගයකුත් පටවාගෙන වේගයෙන් පාර දිගේ යනවා. ගස් කොච්චර කපන්න ඇත්ද? ලී කොටන් පිරුණු ලොරිය දුටු මට පරිසර සංගමයේ ගුරුතුමී මතක් උනා. මේ පාරේ වාහන යන්නෙම නැති තරම්. පාර පටුයි. තාර දාලත් නෑ. නමුත් වාහනය පදවපු කෙනා ගොඩක් වේගයෙන් එය පදවාගෙන ගියා. වාහනය පදවපු මාමා නලාව ගහපු සද්දෙ නිසා අපිව පැත්තකට විසි වෙනවා වගේ දැනුණා. අපේ කන් හිරිවැටිලා ගියා ටික වෙලාවකට. වාහනය අපිව පහුකරගෙන ගිහින් ඈත වංගුවෙන් නොපෙනී ගියා. ඒ එක්කම ඩෝං ගාලා මහ සද්දයක් අපට ඇහුණා.





‘‘ඔයාට ඒ සද්දේ ඇහුනද චූටිටේ?’’ බය වෙච්ච පාර මම චූටිටෙගෙන් ඇහුවා.

"ඔව්." චූටිටේ මගෙ අත තදින් අල්ලාගන්න ගමන් කියුවා.

‘‘ අර වාහනය පෙරලුනාවත්ද?’’ මලීත් මගේ අතින් අල්ලා ගත්තා. අපි සද්දේ ආපු දිශාවට වේගයෙන් දුවගෙන ගියා. හැමතැනම බැලුවත් වාහනය නම් පේන්න තිබුනේ නෑ. අපි තවත් ටිකක් විපරම් කලා. පාර අයිනේ රජයෙන් අපට දීලා තිබුණු වතුර බටය එක්කම කණුව කැලි වලට කැඩිලා තියනවා දැක්ක මට ඉබේටම කෑ ගැස්සුනා. ඒ වතුර බටයෙන් වේගයෙන් වතුර ගොඩක් ගලා යනවා.



අයියෝ අර වාහනය අපේ වතුර බටය හප්පාගෙන ගිහින්.

"චුට්ටේ, මලී, බින්දු හනික එන්න අපි මේ වතුර නවත්තන්න බලමු." මම කෑගැහුවා. නමුත් එයාලා මුකුත් කීවේ නෑ.

"අනේ මට බයයි අපි හනිකට ගෙදර යමු" කියලා මලී කියුවා.

"අපි විගහට මෙතනින් යමු." කිය කියා චුට්ටේ මගේ අතිනුත් අදිනවා.

මට උදව් වෙන්න කිව්වත්, "දැන් හුඟක් හවස් වෙලා. අපි ඉක්මනට ගෙදර යමු" කියලා එයාලා මාව අදිනවා.

"ඔයාලා යන්න. වතුර නවත්තලා මිසක් මම එන්නේ නැහැ" කියලා මම උත්තර දුන්නා. ඔයා එන්නේ නැත්නම් අපි යනව කියල එයාල යන්න ගියා. මම හිතුවෙම නැහැ එයාල මාව දමල යයි කියල. එයාලා වංගුවෙන් හැරිලා නොපෙනී යනවා මම දැක්කා. මම හිතුවෙ ටික දුරක් ගිහින් එයාල ආපහු ඒවි කියල. නමුත් එයාල ආපහු ආවෙ නැහැ. මට ටික ටික බය දැනෙන්න ගත්තා.



වතුර වේගයෙන් ගලා ගිහිල්ලා අපි හැමෝටම බොන්නවත් වතුර නැතිවෙයි කියලා මගේ හිතට ලොකු බයක් දැනුණා. මම ලී කැලි දර වගේ දේවල් හිරකලරා වතුර නවත්වන්න බැලුවත් මගේ මුළු ඇඟම තෙමුණා මිසක් වතුර නැවතුනේ නම් නෑ.
මේ ගැන කියන්න අහල පහල කිසිම කෙනෙක් නැති බව මම දන්නවා. අපේ පරිසර සමිතියේදී පිරිසිදු ජලය ක්‍රමයෙන් අවසන් වන සම්පතක් බවත් ඒය ආරක්ෂා කරගත යුතු සම්පතක් බවත් කියපු හැටි මට මැවිලා පෙනුණා. මට මහා බයක් දැනුණා.



## ~~ පිළිසකර ~~

අවසන් වතාවට අසල තිබුණු බර දර කොටයක් අමාරුවෙන් උස්සලා වතුර ගලන නලේට හිරකලා. ඒකෙන් වතුර ගලායන වේගය ගොඩක්ම අඩු වෙනවා මම බලාන හිටියා. මගේ හිතට පොඩි සහනයක් දැනුණා.

අපේ ගම තියෙයන්නේ සෑහෙන දුරකින් නිසා මම මට පුළුවන් උපරිම වේගයෙන් දිව්වා කෑගහගෙන. ගම්මානේ ලඟදී මාමලා නැන්දලා මාව නැවැත්තුවා.

"මොකද? මොකද පුතේ මේ?" ඔවුන් මගෙන් ඇහුව.

මම එයායාලගේ අතින් අදින ගමන් සිද්ධිය විස්තර කළා.

"අපි හනිකට යමු" කියලා මම කිව්වා.



මාමාලා කිහිපදෙනෙක් අලුත්වැඩියාවට අවශ්‍ය උපකරණ එකතු කර ගත්තා.

මම එක්ක එයාලා හනි හනික සිද්ධිය වුනු තැනට ගියා.

හැමෝම උනන්දුවෙන් එකමුතු වෙලා වැඩ කළා. විශාල වෙහෙසක් අරගෙන මාමාලා නැන්දලා ඒකතු වෙලා වතුර නළේ වතුර කාන්දු වීම නැවැත්තුවා.

එය දුටු මට විශාල සතුටක් දැනුණා.



ඒ වෙනකොට නම් මට හොඳටම මහන්සියි. ඇඟට කිසිම පනක් නැහැ.

මුළු  ඇඟම වතුරෙන් තෙමිලා නිසා ඇඟටත් පුදුම අපහසුවක් දැනුනා.

මාමා කෙනෙක් මාව වඩාගත්තා.

තව කෙනෙක් මගේ පොත් ටික ගන්නවා මම දැක්කා.

කළුවර අතරේ ඈතින් ගමේ පිරිසක් එනවා මම දැක්කා. ඒ අතරේ අම්මයි තාත්තයි මාව හොයාගෙන ඇවිත්.

මාව දාල ගෙදර ගිය චුට්ටෙයි මලීයි ඔවුන් එක්ක ඉන්නවා මම දැක්කා.

එයාල තමයි අම්මවයි තාත්තවයි එක්කන් ඇවිත් තියෙන්නෙ.

එයාල වතුර නලේ හදන්න බඩුත් අරන් ඇවිත්.

“අපි වතුර නලේ හැදුව තාත්තෙ. අපි වතුර නැවැත්තුවා.” මම ආඩම්බරයෙන් කෑගැහුව.



# පැසසුම්

කට්ටිය මොනවදෝ කතා කරනවා.

මම කළ දේ අගය කරන බව මට ඇසුණා.

අම්මගෙයි තාත්තගෙයි මුහුණු සිනාවකින් පිරෙනවා මම දැක්කා.

අම්මයි, තාත්තයි මාව තුරුළු කරන් මගේ ඔලුව අතගෑවා.

මට ගොඩක් සීතල දැණුන නිසා වැඩිපුර තිබුණ රෙදි වලින් නැන්දලා මාව ඔතලා උණුසුම් කළා.

තව මාමා කෙනෙක් හෙට උදේම ගොඩක් දුරින් තියෙන රජයේ කාර්යාලයකට ගිහින්, කළින් තිබුණා වගේම ජල නළය නැවත සකස් කරගැනීම ගැන දන්වන බවත් කිවුවා.

ගෙදරට එනකල්ම තාත්තා මාව වඩාගෙන ආවා. ගමේ සියලුදෙනාම වගේ මට ප්‍රසංශා කරලා එයාලගේ ගෙවල් වලට විසිරිලා ගියා.





කොයිතරම් මහන්සි උනත් පහුවදා මම පාසල් ගියා. අම්මයි තාත්තයි යන්නට එපා කියද්දි පරිසර සංගමයට තියෙන ආසාව නිසා මම විගහට ලෑස්ති උනා. අසනීප ගතියක් තිබුණු නිසා අම්මයි තාත්තයි මාත් එක්ක ආව. ටිකක් පරක්කුත් උනා. පාසැලට ඇතුළුවෙනකොටම හැමෝම පාර ගාව. විදුහල්පතිතුමා මට රතු මල් කළඹක් දුන්න. මට පුදුමයි. මම අම්මගෙයි තාත්තගෙයි මුහුණු බැලුව. සතුටට එයාලට කඳුළු ඇවිත්. මම විදුහල්පතිතුමාට වැඳල ඒක ගත්ත. ළමයි, ගුරුවරු මාව පෙරහැරකින් රැස්වීම් ශාලාවට එක්ක ගියා.

මම කළදේ අගය කරමින් ගුරුවරු උදා රැස්වීමේ කතා කලා. මට ලොකු අභිමානයක් දැනුණා. ඒ එක්කම ලොකු දුකක් දැනුණා පරිසර සංගමයේ ගුරුතුමිය නැති නිසා. ඇය සිටියානම් මා ගැන හුඟක් ආඩම්බර වේවි.

රැස්වීම අවසානයේ පාසලේ සුපුරුදු වැඩසටහනට අනුව වැඩ කළා.පරිසර සංගමයේ ගුරුතුමිය නැති නිසා අද පරිසර සංගමය නොපවත්වන බව අපට දැණුම් දුන්නා.

අපි නිවෙස්වලට යන්නට සූදානමින් සීනුව නාද කරනතුරු බලා සිටියා. ඒ මොහොතේම ඈතින් එන ගුරුතුමිය අපි දැක්කා. පරිසර සංගමය අද පවත්වන බවත් සියළු දෙනා එයට සහභාගී වියයුතු බවත් ඇය දැණුම් දුන්නා.

අපි නැවත රැස්වීම් ශාලාවට ගියා. ඇය අප වටපිටාවේ ඇති සම්පත් ගැන නැවත වරක් අපට කියාදුන්නා. ඒවා අසීමිතව නැති බවත් ඒනිසා අපෙන් පසුව එන අය වෙනුවෙන් ඒවා රැකගතයුතු බවත් හොඳින් පැහැදිළි කළා. ඉන්පසුව මා ඉදිරියට කැඳවූ ඇය ජල සම්පත රැකගැනීමට මා ගත් උත්සාහය ඉහළින් අගය කළා. එයින් නොනැවතී ඇය මා වෙත වටිනා සහතිකපතක් පිරිනැමුවා. තවදුරටත් මා වෙනුවෙන්ම සකසනලද රන් පදක්කමක් ගෙල පැළැන්දූ ඇය ආදරයෙන් මා තුරුළු කරගත්තා. උදා රැස්වීමට නොසිට මා වෙනුවෙන්ම ඇය මේ කටයුතුසඳහා වෙහෙස නොබලා බොහෝ දුර ගොස් ඇතිබව වැටහුණු මගේ ඇස් කඳුලින් තෙත් උනා.

ගොඩ දෙනෙකුගේ යහපත වෙනුවෙන් මම කළ දේ ගැන මගේ හිතට විශාල සතුටක් දැනුණා.

## -- නිමි ---

Ministry of Education
National Library & Documentation Services Board

# CERTIFICATE

THIS IS TO CERTIFY THAT

D. Dulansa Satharasinghe

Participated in the

**“රටක් වටින පොතක් (A book worth a country)” Book writing programme**

conducted by the

**National Library and Documentation Services Board**

in collaboration with

**Ministry of Education**

| | | |
|---|---|---|
| **Prof. G.L. Peiris** | **Dullas Alahapperuma** | **Sonala Gunawardhana** |
| Minister of Education | Minister of Power | Chairman – NLDSB |
| | ( The pioneer of the Ratak Watina Pothak Project ) | |

NATIONAL LIBRARY AND DOCUMENTATION SERVICES BOARD
NO. 14, INDEPENDENCE AVENUE
COLOMBO 07

Official Media Partner

Printed at the State Printing Corporation

Official Media Partner